නෙත් FM

# 5 පහේ පන්තිය

## 2022.06.25

## සෙනසුරාදා සවස 5.00 සිට

## සාකච්ඡා කරන ප්‍රශ්න පත්‍රය

❖ **පහත දැක්වෙන රූපසටහන බලා අංක 01 සහ 02 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




01. B ස්ථානය වාසස්ථානය ලෙස සාදාගන්නා සතෙකු වන්නේ,

(1) නයා (2) වේයා (3) මීයා

02. ගිරවකු හා මාළුවකු බිත්තර දැමිය හැකි ස්ථානයන් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා D (2) C හා D (3) B හා D

❖ **අංක 03 සහ 04 ප්‍රශ්නවල 2, 4, 6 වෙනුවට පිළිවෙළින් ම, ක, න යන අකුරු යොදාගෙන පහත සඳහන් ගණනය කිරීම් සිදු කරන ලදී. ඒ අනුව හිස්තැන්වලට සුදුසු අකුරු මොනවා ද?**

03. ම + ක = .......................... (1) ක (2) න (3) ම

04. න - ම = .......................... (1) ක (2) ම (3) න

05. පහත ඇති ඉලක්කම් මත තීන්ත තවරා එම ඉලක්කම් ඉදිරියෙන් මුද්‍රණය වන පරිදි තිත් ඉරි දිගේ කඩදාසිය දෙකට නවා දිගහැරිය විට ලැබෙන සංඛ්‍යාව කුමක්ද?

| 180 | |
|---|---|

(1) 180018 (2) 180180 (3) 180081

06. | OTAMOT | මෙම අකුරු ලියූ කාඩ්පතක් දෙස කණ්ණාඩියකින් බැලූ විට පෙනෙන ආකාරය වන්නේ,

(1) TOMATO (2) OTAMOT (3) TOAMTO

07. | 1 | 1 | 2 | 6 | ....... | 120 | හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) 24 (2) 12 (3) 60

08. 0 සිට 9 තෙක් ඇති ඉලක්කම් සියල්ලෙහි එකතුව වන්නේ,

(1) 44 කි. (2) 42 කි. (3) 45 කි.

09. එක ළඟ පිහිටි ඉලක්කම් දෙකක් ගුණ කළ විට ලැබෙන සංඛ්‍යාව,

(1) ඔත්තේ සංඛ්‍යාවකි.

(2) ඉරට්ටේ සංඛ්‍යාවකි.

(3) ඔත්තේ හෝ ඉරට්ටේ හෝ සංඛ්‍යාවකි.

10. එකෙනුත් එම සංඛ්‍යාවෙනුත් පමණක් බෙදෙන සංඛ්‍යාවකි.

(1) 13 (2) 9 (3) 15

11. යතුරුපැදිය 30 km ක් ගමන් කරන විට කාරය 80 km ගමන් කරයි. කාරය 20 km ක් ගමන් කරන විට බසය 10 km ක් ගමන් කරයි. අඩුම වේගයක් ඇති වාහනය කුමක් ද?

(1) බසය (2) කාරය (3) යතුරු පැදිය

12. A ගේ පියා B ගේ පුතා නම් B නැමැත්තා A ගේ කවුරුන් ද?

(1) සීයා (2) මුනුපුරා (3) පුතා

13. කණකොක් සුද පෙනෙන්නේ ඉගිලෙන විට ය. මෙම යෙදුමේ අදහස වන්නේ,

(1) දක්ෂයා කැපී පෙනෙන බව ය.

(2) කාගෙත් හොඳ නරක පෙනෙන්නේ වැඩක් කරන විට ය.

(3) හොඳ වැඩ කරන අය කැපී පෙනෙන බව ය.

❖ **අංක 14 සහ 15 ප්‍රශ්නවල ඔරලෝසු තුනක සීනු නාදවන ආකාර පහතින් දී ඇත. ඒ ඇසුරෙන් අසා ඇති පිළිතුරු සපයන්න.**




A ඔරලෝසුව මිනිත්තු 15 කට වරක්

B ඔරලෝසුව මිනිත්තු 30 කට වරක්

C ඔරලෝසුව මිනිත්තු 45 කට වරක්

ඔරලෝසු තුනෙහි වේලාව පෙ. ව. 7.00 ට එකවර නාද විය.

14. නැවත ඔරලෝසු තුනේ ම සීනුව එකවර නාදවන්නේ කීයට ද?
    (1) පෙ. ව. 8.30 (2) පෙ. ව. 7.45 (3) පෙ. ව. 8.00

15. පෙ. ව. 8.00 වන විට නාද වන ඔරලෝසු වන්නේ,
    (1) B හා C ය. (2) A හා C ය. (3) A හා B ය.

❖ **පහත දී ඇති තොරතුරු ඇසුරෙන් අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

උඩ අත්තේ කුරුල්ලකු යට අත්තට ගියහොත් අතු දෙකේම කුරුල්ලන් ගණන සමාන වෙයි. යට අත්තේ කුරුල්ලකු උඩ අත්තට ගියහොත් යට අත්තේ සිටින ගණන මෙන් උඩ අත්තේ සිටින ගණන තුන් ගුණයක් වෙයි.

16. උඩ අත්තේ සිටින කුරුල්ලන් ගණන කීය ද?
    (1) 3 (2) 5 (3) 4

17. අතු දෙකේම සිටින කුරුල්ලන් ගණන කීය ද?
    (1) 8 කි. (2) 7 කි. (3) 5 කි.

18. කම්බියකින් යකඩ වළලු 9ක් සෑදිය හැකි ය. යකඩ වළලු 184ක් සෑදීමට කම්බි කීයක් අවශ්‍ය වේ ද?
    (1) 21 (2) 20 (3) 19

19. පහත දී ඇති තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| |
|---|
| සෑම කුරුල්ලකුට ම පියැඹිය නොහැකිය.<br>පියාඹන සියල්ලන් ම කුරුල්ලන් නොවේ. |

X පියාඹන සතෙකි. ඒ අනුව X පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) කුරුල්ලෙකි. (2) කුරුල්ලකු නොවේ. (3) කිව නොහැක.

20. නංගී ප. ව. 1.00 සිට ප. ව. 3.15 දක්වා ද මල්ලී ප. ව. 2.15 සිට ප. ව. 3.30 දක්වා ද අයියා ප. ව. 2.30 සිට ප.ව. 3.15 දක්වා ද පාඩම් වැඩ කරයි. තිදෙනාම එක්ව පාඩම් වැඩ කළ කාලය කොපමණ ද?

(1) මිනිත්තු 30 (2) පැය 1 මිනිත්තු 15 (3) මිනිත්තු 45

21. එක්තරා වර්ෂයක අප්‍රේල් 15 බදාදා දවසකි. එම වර්ෂයේ මැයි 15 වන දා,

(1) සිකුරාදා දවසකි.
(2) බදාදා දවසකි.
(3) බ්‍රහස්පතින්දා දවසකි.

22. 300යේ බාගයෙන් $\frac{1}{3}$ ට 10ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 30 (2) 60 (3) 50

23. වරුණිගේ දැන් වයස අවුරුදු 12ක් වන අතර නයනි, වරුණිට වඩා අවුරුදු 3කින් වැඩිමහල් ය. නයනිගේ වයස, වරුණිගේ වයස මෙන් දෙගුණයක් වූයේ මීට වසර කීයකට පෙර ද?

(1) 9කට (2) 6කට (3) 3කට

24. පැත්තක් මීටර 15ක් වන සමචතුරස්‍රාකාර මල් පාත්තියක මීටර 1ක පරතරය ඇතිව කණු සිටුවා ඇත. පාත්තිය වටේට ම සිටුවා ඇති මුළු කණු ගණන කීය ද?

(1) 64කි. (2) 60කි. (3) 56කි.

25. ඔරලෝසුවේ පැය කටුවත් මිනිත්තු කටුවත් අතර සෘජුකෝණයකට වඩා වැඩි කෝණයක් සෑදෙන වේලාව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 7.30 (2) 9.00 (3) 2.35

*සරත් ආනන්ද ගුරුතුමා - 0715 745 745*